යම් කිසි වරදකට ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේම පිරිසක් අත්අඩංගුවට ගන්නා මොහොතකදී වුවත්, ඊට හසුවන කාන්තා පාර්ශවය පමණක් ඉස්මතු කරමින් පුවත් වාර්තා කිරීම ඇතැම් පුවත් වාර්තාවන් දක්නට ලැබෙනා කරුණකි.

"බූරුවා ගසමින් සිටි කතක් ඇතුළු තිදෙනෙකු අල්ලයි" සහ "හෝටලයක කාමරයක් අරන් බූරුවා ගැසූ කාන්තාවක් ඇතුළු 16ක් අත්අඩංගුවට අරන්" යන සිරස්තල ඊට උදාහරණයකි.

1) මෙහිදී කාන්තාවන්ව ඉස්මතු කොට සඳහන් කරන්නේ, එකම වරදක් කාන්තාවන් සහ පිරිමින් සිදු කළ විටකදී පවා, කාන්තාවන්ට එම වරදේ වැඩි වගකීමක් පැවරෙන බවක් පෙන්වීමට යැයි ඔබ සිතන්නේද?

2) එය ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් සිදු කෙරෙනා කොන් කිරීමක් සහ ඒ අනුව ආචාර ධර්ම විරෝධී මාධ්‍යකරණයක් නොවන්නේද?

3) මෙම සිරස්තල වෙනුවට "බූරුවා ගසමින් සිටි කතක් සහ පිරිමින් දෙදෙනෙකු අත්අඩංගුවට", "බූරුවා ගසමින් සිටි තිදෙනෙකු අත්අඩංගුවට" හෝ "හෝටලයක කාමරයක් අරන් බූරුවා ගැසූ 16ක් අත්අඩංගුවට අරන්" වැනි විකල්ප සිරස්තලයක් යෙදීම පිළිබඳව ඔබේ අදහස කුමක්ද?

**#MediaEthicsSL #lka #sinhalanews #Aruna #Dinamina**